# බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ (MN-03-2016) තනතුරු සඳහා වන බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024/2025

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN-03-2016) සේවා ගණයට අදාළ පහත දක්වා ඇති තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අදාළ තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව පහතින් දැක්වෙන අතර අයදුම්කරුවන් පහත දක්වා ඇති ආකෘතිය අනුව පිළියෙල කළ අයදුම්පතක් **2025.07.07** දින හෝ එදිනට පෙර විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත ලැබෙන සේ එවිය යුතු ය.

| | | | තනතුරු |
|---|---|---|---|
| i. | කාර්මික නිලධාරී (සංරක්ෂණ සහකාර) | - | 07 |
| ii. | පුරාවිද්‍යා ප්‍රතිරූපණ ශිල්පී | - | 03 |

01. විභාග දිනය :

මෙම විභාගය **2025 සැප්තැම්බර් මස කොළඹ දී** පැවැත්වේ. මෙම විභාගය කල්දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත.

02. බඳවා ගැනීමේ ක්‍රමය :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් ලිඛිත විභාගය සමත්, අදාළ සුදුසුකම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයින්ගේ ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව සහ අයදුම් කර ඇති තනතුරු අනුපිළිවෙළ අනුව එක් එක් තනතුරේ පුරප්පාඩු සංඛ්‍යාව හා සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවා අධ්‍යාපන සුදුසුකම් හා ශාරීරික යෝග්‍යතාව සනාථ කර ගැනීමෙන් පසු බඳවා ගනු ලැබේ.

2.1 ලිඛිත විභාගය :

මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

| අ.අ. | ප්‍රශ්න පත්‍රයේ නම | කාලය | විෂය නිර්දේශය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| i. | බුද්ධි පරීක්ෂණය | පැය 01 | අපේක්ෂකයාගේ තර්කානුකූලභාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. | 100 | 40 |
| ii. | විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 01½ | (අ) කාර්මික නිලධාරී (සංරක්ෂණ සහකාර) තනතුර සඳහා,<br>- වාස්තු සංරක්ෂක මූලධර්ම පිළිබඳ සාමාන්‍ය අවබෝධය<br>- ඓතිහාසික ස්මාරක පිළිබඳ මූලික අවබෝධය<br>- ඇස්තමේන්තු සැලසුම් කිරීම / ඇස්තමේන්තු සකස් කිරීම පිළිබඳ දැනුම<br>- සැලසුම් ඇඳීම හා උපකරණ පිළිබඳ අවබෝධය/ ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ දැනුම<br><br>(ආ) පුරාවිද්‍යා ප්‍රතිරූපණ ශිල්පී තනතුර සඳහා,<br>- මූලික ඡායාරූප උපකරණ පිළිබඳ දැනුම<br>- ඡායාරූප ගැනීමේ තාක්ෂණ ක්‍රියාකාරීත්වය පිළිබඳ දැනුම ඡායාරූපකරණයට අදාළ රසායන ද්‍රව්‍ය පිළිබඳ දැනුම<br>- මුද්‍රණ කඩදාසි වර්ග පිළිබඳ දැනුම<br>- ඡායාරූපකරණය පිළිබඳ මූලධර්ම | 100 | 40 |

2.2 විභාග මාධ්‍යය :

i. විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

ii. අපේක්ෂකයකු විභාගයේ දී පෙනී සිටින සියලු ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතු ය.

iii. තම අයදුම්පතෙ හි සඳහන් විභාග භාෂා මාධ්‍යය වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩදෙනු නොලැබේ.

2.3 *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය* :

ලිඛිත විභාගයේ සියලු ප්‍රශ්න පත්‍රවලට අයදුම්කරුවන් පෙනී සිටිය යුතු අතර සමත් වීම සඳහා එක් එක් විෂයට 40%ක් වූ අවම ලකුණු ලබාගත යුතුය. විභාගය සමත් අයදුම්කරුවන් අතුරින් ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව සහ අයදුම් කර ඇති තනතුරු අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. මෙම සම්මුඛ පරීක්ෂණයේදී අධ්‍යාපන සුදුසුකම් හා ශාරීරික යෝග්‍යතාව සනාථ කරගනු ලබන අතර, ඒ සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.

03. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :**

3.1 *අධ්‍යාපන සුදුසුකම් :*

**කාර්මික නිලධාරී (සංරක්ෂණ සහකාර)/ පුරාවිද්‍යා ප්‍රතිරූපණ ශිල්පී තනතුරු සඳහා-**

විද්‍යා/ගණිත හෝ තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, තාක්ෂණය සඳහා විද්‍යාව හෝ ඉංජිනේරු තාක්ෂණවේදය යන විෂයන්ගෙන් විෂයන් දෙකක් සහිතව අ.පො.ස.(උ/පෙළ) විභාගය එකවර සමත් වීම;

සහ

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමර්ථය සහිතව එකවර විෂයන් 06 කින් අ.පො.ස.(සා/පෙළ) විභාගය සමත් වීම.

3.2 *වෘත්තීය සුදුසුකම්* :

**3.2.1** ***කාර්මික නිලධාරී (සංරක්ෂණ සහකාර)*** **තනතුර සඳහා-**

(අ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික විද්‍යාලයකින් ජාතික තාක්ෂණික (සිවිල්/පරිමාණ හා මිනුම්) සහතිකය ලබා තිබීම හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඊට සමාන සුදුසුකමක් ලබා තිබීම;

(ආ) මොරටුව විශ්වවිද්‍යාලයෙන් හෝ අම්පාරේ හාඩි ආයතනයෙන් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්), ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්),

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්),

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්), ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු ආකාරයෙන් සම්බන්ධ යැයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම්,

රැකියා ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

3.2.2 **පුරාවිද්‍යා ප්‍රතිරූපණ ශිල්පී තනතුර සඳහා-**

(අ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආයතනයකින් එක් අවුරුදු පූර්ණකාලීන හෝ දෑ අවුරුදු අර්ධකාලීන ඡායාරූපකරණය පිළිබඳ පාඨමාලාවක් සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම.

(ආ) ඡායාරූපකරණය පිළිබඳ ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

**3.3** ***කායික සුදුසුකම් :***

අපේක්ෂකයා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි වන පරිදි මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

බඳවා ගැනීම:

ඉහත 3.1 හි අධ්‍යාපන සුදුසුකම් සමග 3.2 හි නියමිත තනතුරට අදාළව (ආ) කොටසෙහි සඳහන් වෘත්තීය සුදුසුකම් සහිත අයදුම්කරුවන්, III ශ්‍රේණියේ තනතුරකට බඳවාගනු ලැබේ.

ඉහත 3.1 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සමග 3.2 හි නියමිත තනතුරට අදාළව (අ) කොටසෙහි සඳහන් වෘත්තීය සුදුසුකම් සහිත අයදුම්කරුවන්, වසර 01ක පුහුණු කාලසීමාවකට යටත්ව බඳවාගනු ලැබේ.

ඉහත 3.1 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් පමණක් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන්, වසර 02 ක පුහුණු කාලසීමාවකට යටත්ව බඳවාගනු ලැබේ.

**පුරාවිද්‍යා ප්‍රතිරූපණ ශිල්පී තනතුරට බඳවා ගැනීම පිළිබඳ තොරතුරු :**

*පුහුණු කාලසීමාව අවසානයේ ශ්‍රේණියට බඳවා ගැනීම* :

(i.) දෑ අවුරුදු පුහුණු කාලයකට බඳවා ගනු ලබන අපේක්ෂකයින් තනතුරට අදාළ විෂය නිර්දේශය අනුව ලබා ගන්නා දෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිමකොට අදාළ විභාගය සමත් වීමෙන් පසු III වන පන්තියට අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ තබනු ලැබේ.

(ii.) එක් අවුරුදු පුහුණු කාලයකට බඳවා ගනු ලබන අපේක්ෂකයින් තනතුරට අදාළ විෂය නිර්දේශය අනුව ලබා ගන්නා එක් වසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිමකොට අදාළ විභාගය සමත් වීමෙන් පසු III වන පන්තියට අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ තබනු ලැබේ.

(iii.) ඉහත i, ii යටතේ පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත්වීමට අපොහොසත් වන ආධුනිකයන් වෙතොත් ඔවුනට මාස 06 කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාවක් ලබා දෙනු ලබන අතර, එසේ දීර්ඝ කරනු ලබන කාලසීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන ආධුනිකයන්ගේ සේවය අවසන් කරනු ලැබේ.

III වන ශ්‍රේණියට අදාළ සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු සම්පූර්ණ කිරීමෙන් පසුව පිළිවෙළින් වසර 01 හා 02 ක පුහුණු කාලයකට යටත්ව සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු සම්පූර්ණ කෙරේ.

3.4 *වෙනත් සුදුසුකම්* :

3.4.1 ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
3.4.2 අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
3.4.3 වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කරන ලද දිනය 2025.07.07 වැනි දින හෝ එදිනට පෙර දිනයක් විය යුතු ය.
3.4.4 මෙම විභාගය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් 2025.07.07 දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.
3.4.5 යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

04. **වයස් සීමාව :**

2025.07.07 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

(ඒ අනුව 2007.07.07 දිනට හෝ ඊට පෙර හා 1995.07.07 දිනට හෝ ඊට පසු උපන්දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

05. ***මාසික වැටුප් පරිමාණය*** :

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු.31,040 – 10 x 445 – 11 x 660 – 10 x 730 – 10 x 750 – රු. 57,550/- (MN-03-2016) වේ.

06. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

6.1 මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතු ය.

6.2 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, 2020.01.28 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ (MN-03-2016) තනතුරු සඳහා වන බඳවාගැනීමේ පටිපාටියට අදාළ සියලු කොන්දේසිවලට ද එම බඳවාගැනීමේ පටිපාටියේ කර ඇති හෝ මින් මතු කෙරෙන සංශෝධනවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ (MN-03-2016) III වැනි ශ්‍රේණියේ/ පුහුණු කිරීමේ ශ්‍රේණියේ තනතුරකට පත්කරනු ලැබේ.

6.3 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද රාජකාරියෙහි හෝ පත්කරන ලද ප්‍රදේශයක රාජකාරි භාරගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම් අහෝසි කිරීමට කටයුතු කෙරෙනු ඇත.

6.4 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය. ඔබ විසින් 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි විධිවිධාන අනුව අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු වේ.

07. **අයදුම් කිරීමේ ක්‍රමය :**

7.1 අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8 ½"x 12½" (A4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර ඉදිරිපත් කළ යුතුය.1.0 සිට 5.0 තෙක් වන ශීර්ෂ අයදුම්පතෙහි කඩදාසියේ පළමුවැනි පිටුවේද, 6.0 සිට 8.0 තෙක් එහි දෙවන පිටුවේ ද 9.0 සිට 10.0 දක්වා තෙවන පිටුවේ ද වන පරිද්දෙන් තම අයදුම්පත සකස් කළයුතු අතර එය විභාගයට පෙනී සිටීමට ඉල්ලුම්කරන මාධ්‍යයෙන් තම අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතු ය. අයදුම්පතේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය. නිවේදනයේ ඇතුළත් ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින් අයදුම්පත යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේ ද යන්න පිළිබඳව ද, නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පතට ඇතුළත්කොට ලදුපත අලවා ඇත්ද යන්න පිළිබඳව ද විමසිලිමත් විය යුතු ය.

ඔබගේ පහසුව සඳහා නිවැරදිව සකස් කරන ලද විභාග අයදුම්පත පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් (www.archaeology.gov.lk) බාගත කළ හැකි ය.

7.2 අයදුම්පත සමඟ කිසිදු සහතිකයක පිටපතක් අමුණා එවීම අවශ්‍ය නොවේ.

7.3 විභාග ගාස්තුව රු.600/-ක් වන අතර එම ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ ආදායම් ශීර්ෂ අංක 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක්/දිස්ත්‍රික්/ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබාගන්නා ලදුපත එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කිසිදු හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ. එම ලදුපතේ ඡායාපිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකි ය.

7.4 විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපැලෙන් **2025.07.07** දින හෝ ඊට පෙර ලැබෙනු පිණිස විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ යන ලිපිනය වෙත එවිය යුතුය. අයදුම්පත බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ**

**අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ (MN-03-2016) තනතුරු සඳහා වන බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024/2025"** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු අතර අයදුම්පත භාරගන්නා අවසන් දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7.5 අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, හෝ බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන පූජකවරයකු විසින් සහතික කර තිබිය යුතු ය.

7.6 සෑම ආකාරයකින් ම සම්පූර්ණ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

08. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ පසුවන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසු ද තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම් එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි වන පරිදි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබාගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළයුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය පමණි. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

09. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(i.) ජාතික හැඳුනුම්පත;
(ii.) වලංගු විදේශ ගමන් බලපත්‍රය;
(iii.) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කරගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

10. **සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම :**

විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

විභාගයට පෙර හෝ විභාගය පවත්වන අතරතුරදී හෝ විභාගයෙන් පසුව හෝ යන ඕනෑම අවස්ථාවකදී අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කෙරේ. රාජ්‍ය සේවයට බඳවා ගැනීමෙන් අනතුරුව අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව හෝ දැන දැනම ඉදිරිපත් කර ඇති බව තහවුරු වුවහොත් හෝ යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇති බව අනාවරණය වුවහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කෙරේ.

11. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

12. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනය භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව,
කොළඹ 07.